සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 1 1/2 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:
- මෙම ලිඛිත ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. I පත්‍රය සඳහා ලකුණු 20ක් ද, II පත්‍රය සඳහා ලකුණු 30ක් ද වශයෙන් මුළු ලකුණු සංඛ්‍යාව 50කි.
- ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50කි.
- අවසාන ලකුණු ගණනය කිරීමේ දී, ලිඛිත හා ප්‍රායෝගික ප්‍රශ්නපත්‍රවල ලකුණු එකතුව 100% ගණනය කර ලබාදිය යුතු ය.

## I කොටස

❖ අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) භූමිකා රැසක් දැකිය හැක්කේ,
- (1) නාට්‍යයක් තුළ ය.
- (2) චරිතයක් තුළ ය.
- (3) ප්‍රාසංගික කලාවන් තුළ ය.
- (4) වේදිකාවක් තුළ ය.


(02) ප්‍රේක්ෂකයා නාට්‍ය පෙළ දකින්නේ,
- (1) රූපණය මගිනි
- (2) අභිනය මගිනි
- (3) රංග අභ්‍යාස මගිනි
- (4) නාට්‍ය ශෛලිය මගිනි

(03) ස්වභාවිකත්වයට සමීප කතා පුවතක් අන්තර්ගත වන්නේ,
- (1) නාට්‍යධර්මී නාට්‍යවල ය.
- (2) ලෝකධර්මී නාට්‍යවල ය.
- (3) ශෛලිගත නාට්‍ය තුළ ය.
- (4) මිශ්‍ර ශෛලිය තුල ය.


(04) නළුවෙකුගේ ප්‍රධාන ප්‍රකාශන මාධ්‍ය වන්නේ,
- (1) නළුවාගේ රංගන හැකියාවයි.
- (2) නළුවාගේ සංවාදයයි.
- (3) නළුවාගේ ශරීරයයි.
- (4) නළුවාගේ මුහුණයි

(05) සතත අභ්‍යාසය මගින්
- (1) පරිකල්පනය වර්ධනය වේ.
- (2) නිර්මාණශීලීබව වර්ධනය වේ.
- (3) නිර්මාණාත්මක ශක්තිය වර්ධනය වේ.
- (4) මතකය වර්ධනය වේ.

❖ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා පහත සඳහන් ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ට

(06) ජාතක කථා, පුරාවෘත්ත හා ජන කතා ඇසුරින් නාට්‍ය නිර්මාණය කළ පුද්ගලයා දැක්වෙන්නේ,

(1) "ක" ඡායාරූපයේ ය.
(2) "ග" ඡායාරූපයේ ය.
(3) "ජ" ඡායාරූපයේ ය.
(4) "ට" ඡායාරූපයේ ය.

(07) ''ෆෙඩ්රික්, ගාර්ෂියා ලෝකා'' ගේ "යෙර්මා" නාට්‍ය ඇසුරින් "මූදු පුත්තු" නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරු දැක්වෙන්නේ,

(1) "ක" ඡායාරූපයේ ය.
(2) "ග" ඡායාරූපයේ ය.
(3) "ජ" ඡායාරූපයේ ය.
(4) "ට" ඡායාරූපයේ ය.

(08) ඉහත ''ජ'' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු විසින් පරිවර්තනය කරන ලද "මරාසාද්" නාට්‍යයේ මුල් කෘතිය වන්නේ

(1) ජුලියස් හේ ගේ the horse නාට්‍යයයි.
(2) චැපෙක් සහෝදරයන්ගේ Insect play නාට්‍යයයි.
(3) පීටර් වයිස්ගේ Marat sade නාට්‍යයයි.
(4) ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව්ගේ The Elder Son නාට්‍යයයි.

(09) "විවෘත වීදි නාට්‍ය කණ්ඩායම" බිහිකිරීමේ පුරෝගාමියා වූ නාට්‍යකරු දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) "ක" ය. (2) "ග" ය. (3) "ජ" ය. (4) "ට" ය.

(10) "ක" ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරු විසින් ලාංකික නාට්‍ය කලාවට දායාද කර දුන් රංග ශෛලිය වන්නේ,

(1) ලෝකධර්මී නාට්‍ය ශෛලියයි.
(2) නාට්‍යධර්මී නාට්‍ය ශෛලියයි
(3) ස්වභාවිකවාදී රංග ශෛලියයි.
(4) එපික් රංග ශෛලියයි.

❖ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා නිවැරදි වරණය තෝරන්න.**

(11) රූපණයේ දී නළුවා තම වේශය හැර වෙනත් අයකුගේ වේශය ගැනීම හඳුන්වන්නේ,

(1) නළුවරණය නමිනි
(2) සමාරෝපය නමිනි.
(3) අනුකරණය නමිනි
(4) අභිරූපණය නමිනි.

(12) නාට්‍යයේ විවිධ අවස්ථාවන් මවාපෑමට සුදුසු වන පරිදි වේදිකාව සකස් කිරීම හඳුන්වනු ලබන්නේ,

(1) පසුතල නිර්මාණය වශයෙනි.
(2) අංග රචනය වශයෙනි.
(3) වේෂභූෂණය වශයෙනි.
(4) ආලෝකකරණය වශයෙනි.

(13) සිංහල සහ ඉංග්‍රීසි වේදිකාවේ වඩාත් ප්‍රකට රංග වින්‍යාසකරුවෙක් වන්නේ,

(1) හෙන්රි ජයසේන ය.
(2) ජෙරොම් ද සිල්වා ය.
(3) බන්දුල ජයවර්ධන ය.
(4) ගුණසේන ගලප්පත්ති ය.

(1) වේෂභූෂණ හා අංග රචනා යොදාගනී.

(2) සතර අභිනය යොදාගනී

(3) අභ්‍යන්තර සමාරෝපය යොදා ගනී.

(4) විවිධ භූමිකා යොදාගනී..

(15) චරිත නිරූපණයේ දි නළුනිළියන් අතර අක්ෂි සබඳතාවය රැක ගැනීමට පුහුණු කළ යුතු අභ්‍යාසයකි.

(1) සමාරෝප අභ්‍යාස (2) අභිරූපණ අභ්‍යාස

(3) දර්පන අභ්‍යාස (4) අනුකරණ අභ්‍යාස

❖ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති පිළිතුරු ඇසුරෙන් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(16) බෞද්ධ අධ්‍යාපන පුනරුදය සඳහා ගෙනගිය ඓතිහාසික අරගලය හා කැපකිරීම ........................................................ තුළින් විද්‍යමාන වේ.

(17) අද්භූත කතා පුවතකින් යුත් "මාහේනේ කතාව" ............................................ ගේ නිර්මාණයකි.

(18) නාට්‍ය නිෂ්පාදනය සඳහා මුදල් වැයකරන්නා ............................................................ වේ.

(19) නාට්‍යයක් යනු ................................................................. ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

(20) "රාවනේෂන්" නම් අනුවර්තන නාට්‍ය .................................................. සම්ප්‍රදායට අනුව ලියන ලද රාමායණය ඇසුරෙන් නිර්මාණය කර ඇත.

(මධුර ජවනිකා / ආනන්ද ජවනිකා / ගුණසේන ගලප්පත්ති/ සාමූහික / කේවල / අර්ථපති / වඩමෝඩි, තෙන්මෝඩි

ලකුණු 1 x 20 = 20

## II කොටස

◆ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

(01) (i) කදාවළලු නාට්‍ය පෙළ රචනය සඳහා ඇසුරු කරගත් ජාතකය නම් කරන්න. (ලකුණු 01)

(ii) නාට්‍යයේ ප්‍රධාන චරිතය නම් කරන්න. (ලකුණු 01)

(iii) නාට්‍ය දාෂ්ඨියෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද? (ලකුණු 02)

(iv) නාට්‍යයේ ආරම්භය හා අවසානය සනිටුහන් කරන ගායනය ඉදිරිපත් කරන්නේ කවු ද? ලකුණු 02)

(v) මෙම නාට්‍ය නිර්මාණය වී ඇති ශෛලිය කුමක් ද? (ලකුණු 02)

(vi) මෙම නාට්‍ය රචකයාගේ පරමාර්ථය වන්නට ඇත්තේ කුමක් ද? (ලකුණු 02)

(ලකුණු 10)

(02) (i) ආනුෂංගික ශිල්ප අයත්වන අභිනය කුමක් ද? (ලකුණු 02)

(ii) ඔබ දන්නා ආනුෂංගික කලාවන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) නාට්‍යයක් සඳහා ආනුෂංගික කලාවන් භාවිතයෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(03) (i) රංග ක්‍රීඩාවල යෙදීමේ අරමුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) රංග ක්‍රීඩාවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න (ලකුණු 03)

(iii) පන්ති කාමරයේ දී ඔබ උගත් රංග ක්‍රීඩාවක යෙදෙන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 05)

(04) (i) අංග රචනයේ දී මුහුණ බෙදෙන ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 02)

(ii) මූලික වශයෙන් අංග රචනයේ බෙදීම දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) අංග රචනා ශිල්පියෙකු අංග රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න. ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 09 | විෂයය / பாடம் / Subject නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper ප්‍රායෝගික පරීක්ෂණය |

(01) පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල) (ලකුණු 20)

(i) නිර්දේශිත නාට්‍ය පෙළෙහි තමන් තෝරා ගත් චරිතයක සංවාද කොටසක් ඉදිරිපත් කිරීම (විනාඩි 02යි) (ලකුණු 10)

(ii) ගුරුවරයා විසින් තෝරා දෙන සංවාද කොටසක් ඉදිරිපත් කිරීම (විනාඩි 02යි) (ලකුණු 10)

නිර්ණායක
1. කටහඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
2. චරිතයට හා අවස්ථාවට අනුකූලවීම
3. භාවාත්මක නිරූපණය
4. ශාරීරික ප්‍රකාශනය

(02) ක්ෂණික නිරූපණ (කේවල)
දෙන ලද චරිතයක සිද්ධියක් / අවස්ථාවක් නාට්‍යානුසාරීව ගොඩ නගමින් එසැනින් නිරූපණය කර පෙන්වීම (විනාඩි 03යි) (ලකුණු 10)

නිර්ණායක
1. නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගීම
2. කටහඬ, උච්චාරණය චරිතයට, අවස්ථාවට උචිත වීම
3. යෝග්‍ය භාවමය ප්‍රකාශනය
4. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය

(03) නාට්‍ය ගීතය (කේවල)
ශිෂ්‍යයා කැමැති ඕනෑම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කිරීම
(විනාඩි 03යි) (ලකුණු 10)

නිර්ණායක
1. නිවැරදි තනුව හා තාලය
2. නිවැරදි පදමාලාව හා මතකය
3. මනෝභාවික ප්‍රකාශනය
4. ශාරීරික ප්‍රකාශනය

(04) කථා පුවතක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම (කේවල)
(විනාඩි 03යි) (ලකුණු 10)

නිර්ණායක
1. කථාන්දර තෝරාගැනීම හා ඒ පිළිබඳ අවබෝධය
2. කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
3. චරිතයට හා අවස්ථාවට උචිත භාවමය නිරූපණය
4. ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම හා අවකාශ භාවිතය

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා | ලකුණු 50 |
| ප්‍රායෝගික පරීක්ෂණය සඳහා | ලකුණු 50 |
| මුළු ලකුණු | 100 |